# 4.

## කරණීය මෙත්ත සූත්‍රය

1. කරණීයමත්ථ කුසලේන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූ ච සූජූ ච
සුවචෝ චස්ස මුදු අනතිමානී

2. සන්තුස්සකෝ ච සුභරෝච
අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච
අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

3. න ච ඛුද්ධං සමාචරේ කිඤ්චි
යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

4. යේ කේචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තා වා
මජ්ඣිමා රස්සකාණුකථූලා

5. දිට්ඨා වා යේව අද්දිට්ඨා
යේ ච දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසී වා
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා



## කරණීය මෙත්ත සූත්‍රය (සිංහල තේරුම)

1. ශාන්ත පද සංඛ්‍යාත නිවන් සුවය ලබනු කැමැති, මතු දියුණුවෙහි සමර්ථයා එයට නිසි දේ කළ යුත්තේ ය. ඔහු දක්ෂ විය යුතු ය. ඍජු විය යුතුය. මැනැවින් ඍජු විය යුතු ය, කීකරු විය යුතුය. මෘදු විය යුතු ය. අනතිමානී විය යුතුය.

2. (ඔහු) ලද දෙයින් සතුටු වන්නෙක් ද, පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක් ද, බොහෝ කටයුතු නැත්තෙක් ද, සැහැල්ලු පැවතුම් ඇත්තෙක් ද, සන්සුන් ඉඳුරන් ඇත්තෙක් ද, නිසි නුවණ ඇත්තෙක් ද, ඇමුණුගති ඇත්තෙක් ද, පවුල්හි නො ඇලුණෙක් ද විය යුතු ය.

3. (ඔහු) නුවණැත්තන් ගරහන කුඩා වූ හෝ වරදක්වත් නොකරන්නේ ය. සියලු සත්ත්වයෝ සැප ඇත්තෝ වෙත්වා භය නැත්තෝ වෙත්වා සුඛිත සිත් ඇත්තෝ වෙත්වා යි. (ද)

4. (කෙලෙස් නිසා) බියෙන් තැතිගත් සත්ත්වයෝ ද, එසේ නොවී ස්ථාවරව සිටින සත්ත්වයෝ ද, දිගු, මහත, මධ්‍යම ප්‍රමාණ සිරුරු ඇත්තෝ ද, ඉතා ක්ෂුද්‍ර සියුම් කය ඇති හා ස්ථුල ශරීර ඇත්තෝ ද,

5. පෙනෙන නොපෙනෙන හෝ දුර, නුදුර හෝ ඉපදීමට සිටින, ඉපදී සිටින හෝ සියලු සත්ත්වයෝ සුඛිත වෙත්වායි ද මෙත් වඩන්නේය.

6. න පරෝ පරං නිකුබ්බේථ
නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

7. මාතා යථා නියං පුත්තං
ආයුසා ඒකපුත්තමනුරක්ඛේ
ඒවම්පි සබ්බභූතේසු
මානසං භාවයේ අපරිමාණං

8. මෙත්තං ච සබ්බලෝකස්මිං
මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියඤ්ච
අසම්බාධං අවේරං අසපත්තං

9. තිට්ඨං චරං නිසින්නෝ වා
සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතී'ති.



6. එකෙකු අනෙකෙකු නොරවටන්නේ ය, අනෙකෙකුට අවමන් නොකරන්නේ ය. රොස් සිතින් තරහ සිතින් එකෙකු අනෙකෙකුට දුක් කැමති නොවන්නේ ය.

7. මවක් යම් සේ තම එකම පුතු දිවි පුදා හෝ රකින්නේ ද එපරිද්දෙන් ම සියලු සත්ත්වයන් වෙත අපමණ මෙත් සිත වඩන්නේ ය.

8. උඩ, යට, සිරස (හරස්) අත, වෛරී සිතිවිලි වලින් බාධාවකින් තොරව, සතුරන් ද රහිතව සියලු සත වෙත අපමණ මෙත් සිත වඩන්නේය.

9. සිටින කල, යනෙන කල, හිඳින කල, නිදන කල යම්තාක් අවදිව සිටිත් ද ඒ තාක් මේ මෙත් සිත ඉටාගන්නේ ය. එය මේ සසුනෙහි බ්‍රහ්ම විහාර (බඹ විහරණ) යැයි කියන ලද්දේ ය.

10. මිථ්‍යාදෘෂ්ටියට නොපැමිණ, සිල්වත්ව, දර්ශන සම්පත්තියෙන් යුතුව, කාමයන්හි ගිජු බව දුරු කොට ඒකාන්තයෙන් නැවත මව්කුස සයනයට (පිළිසිඳගැනීම) නො එන්නේ ය.